# ප්‍රවාහන අමාත්‍යාංශය

# කාර්යසාධන වාර්තාව - 2021

**7 වෙනි මහල**
**සෙත්සිරිපාය - අදියර II**
**බත්තරමුල්ල**

**2022 - ජුනි**

# පටුන

**1. පරිච්ජේදය- ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය** ........ 3
1.1 හැඳින්වීම ........ 3
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු ........ 4
1.3 ප්‍රධාන කාර්යන් ........ 5
1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන ........ 6
1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු ........ 7
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන ........ 7
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ........ 7
**2. පරිච්ජේදය- ප්‍රගතිය හා ඉදිරි දැක්ම** ........ 8
**3. පරිච්ජේදය- 2021 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය** ........ 11
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ........ 11
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 13
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ........ 14
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් ........ 16
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ........ 16
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ........ 16
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ... 17
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ........ 17
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව ** ........ 17
**4 පරිච්ජේදය- කාර්ය සාධන දර්ශක** ........ 18
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ........ 18
**5 පරිච්ජේදය- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** ........ 19
5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු ........ 19
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ........ 20
**6 පරිච්ජේදය- මානව සම්පත් පැතිකඩ** ........ 22
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 22
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන අයුරු ........ 22
6.3 මානව සම්පත් සංවර්ධනය ........ 22
**7 පරිච්ජේදය- අනුකූලතා වාර්තාව** ........ 23

# 01 පරිච්ඡේදය

## 1.1 හැඳින්වීම

රටක ආර්ථික හා සමාජ සංවර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා ක්‍රමවත් වූ ප්‍රවාහන පද්ධතියක් අත්‍යවශ්‍යයෙන් තිබිය යුතුය. දිනෙන් දින වැඩිවන ප්‍රවාහන ඉල්ලුම හමුවේ පැනනැඟී ඇති විවිධ ගැටලු විසඳීම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති රාමුවට අනුකූලව නවීන තාක්ෂණික ක්‍රමවේදයන් යොදා ගැනීම හා ඒ තුළින් රටේ සංවර්ධන ක්‍රියාවලිය පවත්වා ගැනීම ප්‍රවාහන අමාත්‍යාංශයේ පුළුල් අරමුණ වේ.

වැඩිවන ප්‍රවාහන ඉල්ලුම හමුවේ පොදු ප්‍රවාහන සේවාවන්හි කාර්යක්ෂමතාවය සහ සුවපහසුව ප්‍රමාණවත් නොවන අතරම, මගී ප්‍රවාහනයට ලබාදෙන ආංශික දායකත්වය සීඝ්‍රයෙන් පහත වැටෙමින් පවතී. කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ජනතාව පොදු ප්‍රවාහන මාධ්‍යයන් වලින් තවදුරටත් ඈත්වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබිණ. මේ නිසා පෞද්ගලික ප්‍රවාහන ආංශික දායකත්වය පසුගිය වර්ෂයන්හී දී වේගයෙන් ඉහල ගොස් ඇති අතර මාර්ගයන්හි ධාවනය වන වාහන ප්‍රමාණය ඉහල යාමට සාපේක්ෂව මාර්ග ධාරිතාවය ඉහල නැංවීමේ සීමාවන් පවතින බැවින්, ඇති වී තිබෙන අධික මාර්ග තදබදයට පිළියම් වශයෙන් බුද්ධිමය ප්‍රවාහන පද්ධතියක් (Intelligent Transport Systems) හඳුන්වා දීම වැනි වැඩසටහන් සැලසුම් කොට ඇති අතර ඉදිරි කාලය තුළදී ඒවා ඵලදායිව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටී.

ශ්‍රී ලංකා දුම්රිය සේවය මගින් මගී ප්‍රවාහනය සඳහා සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් ලබා දෙන අතර එම කටයුතු තවත් පුළුල් කිරීම සඳහා මහව-ඕමන්තේ දුම්රිය මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු, දකුණු පයාගල-අලුත්ගම සහ පොල්ගහවෙල-කුරුණෑගල ද්විත්ව දුම්රිය මාර්ග ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම සැලසුම් කරන ලදි. කොළඹ නගරය වෙත දිනපතා ඇදී එන මගී ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා කොළඹ තදාසන්න දුම්රිය සේවාව වැඩිදියුණු කිරීමේ අරමුණෙන් මාර්ග පද්ධතිය, මාර්ග සංඥා, දුම්රිය මැදිරි සහ එංජින් අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත.

මගී ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා වැඩිම දායකත්වය ලබා දෙන පොදු ප්‍රවාහන බස් සේවය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම මූලික කොට ගනිමින් පහසු හා විශ්වාසදායි පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමයක් හඳුන්වා දීම, ජංගම දුරකතන හා අන්තර්ජාලය ඔස්සේ බස් සේවා පිළිබඳ තොරතුරු ලබා ගැනීම හා ආසන වෙන් කරවා ගැනීම සඳහා මෘදුකාංගයක් MyBus-SL නමින් සකස් කර ඇති අතර බස් රථ වල GPS සවි කිරීම තුළින් ද මෙය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දී ඇත.

ගෝලීය කොවිඩ් වසංගත තත්ත්වය හමුවේදී සෞඛ්‍යාරක්ෂිතව ප්‍රවාහන සේවා සැපයීමේ වගකීම දරමින් පෞද්ගලික බස් හිමියන් වෙත සහන සලසමින් හා දුම්රිය ස්ථානයන්, බස් පර්යන්තයන් විෂබීජහරණය වැනි සෞඛ්‍යාරක්ෂිත පියවර රැසක් ගනිමින් ජනතාවට ප්‍රවාහන සේවා බාධාවකින් තොරව සැපයීම සඳහා අමාත්‍යාංශයේ මග පෙන්වීම පරිදි අනුබද්ධිත ආයතන කටයුතු කරන ලදී. තවද තෝරාගත් දුම්රිය ස්ථාන 10 ක සහ බස් ඩිපෝ 28 ක සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රු.මි. 295 ක ලෝක බැංකු මූල්‍ය ආධාර යටතේ Contingent Emergency Response Component (CERC) ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

තිරසාර ප්‍රවාහනයට අනුගත වෙමින්, මගීන්ට සුවපහසු සහ ආරක්ෂිත පොදු බස් ප්‍රවාහන සේවාවක් සැපයීම තුළින් කොළඹ සහ තදාසන්න ප්‍රදේශවලට පැමිණෙන වාහන ප්‍රමාණය අවම කිරීම සඳහා හඳුන්වා දුන් Park and Ride සංකල්පය ක්‍රියාවට නංවා ඇති අතර, එමඟින් හරිතාගාර වායු විමෝචනය නිසා සිදුවන පාරිසරික දූෂණය අවම කිරීමට, ගමන් කාලය අවම කිරීමට සහ මගීන්ගේ මානසික ආතතිය අවම කිරීමට ද දායකත්වය සපයයි.

"සෞභාග්‍යයේ දැක්ම" තුළ රටේ ප්‍රවාහනය පිළිබඳව දක්වා ඇති මගපෙන්වීම් මැනවින් හඳුනාගෙන කොවිඩ් වසංගතය ඇතුළු අනෙකුත් අභියෝගයන් හමුවේ හඳුනාගත් සංවර්ධන ඉලක්කයන් යථාර්තයක් කරගනිමින් ජනතාවට ප්‍රමිතියෙන් යුත් කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිසම සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව උපරිම දායකත්වයෙන් කටයුතු කර ඇත. පවතින සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුකූලව ප්‍රවාහන සේවාව පවත්වාගෙන යාම සහ ප්‍රතිපාදන වෙන්කර ගැනීම යන අභියෝග හමුවේ සංවර්ධන ඉලක්කයන් සැලසුම් කළ අයුරින් ලඟා කරගැනීමට උපරිමව උත්සාහ දරන ලද වර්ෂයක් ලෙස 2021 වර්ෂය හැඳින්විය හැක.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

**දැක්ම**

ශ්‍රී ලංකාව කලාපය තුළ ප්‍රමුඛතම මහජන කේන්ද්‍රීය ප්‍රවාහන පද්ධතිය සහිත රට බවට පත් කිරීම.

**මෙහෙවර**

ජනතාවගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම උදෙසා නව්‍යතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරමින් ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ තිරසාරව පවත්වාගෙන යාම.

**අරමුණු**

- මගීන්, භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ සංචාරක ප්‍රවාහන පහසුකම් සැපයීම.
- මහජන විශ්වාසය දිනා ගනිමින් රථවාහන තදබදය සහ මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා කාලසටහනකට අනුව ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම.
- ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම.
- මහාමාර්ග හා දුම්රිය මාර්ගවලට සම්බන්ධ පරිසර හිතකාමී සහ මගී හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම.
- 1991 අංක 37 දරණ ජාතික ප්‍රවාහන කොමිෂන් පනත සහ 1950 අංක 18 දරණ දුම්රිය පනත ක්‍රියාත්මක කිරීම

## 1.3 ප්‍රධාන කාර්යයන්

1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "කාර්යක්ෂම සහ පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා ප්‍රවාහන ජාලය සංවර්ධනය කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ප්‍රවාහන විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
    - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
    - ජාතික ගමනාගමන කොමිසම
    - මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

2. පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා නීති රීති සකස් කිරීම.

3. පොදු ප්‍රවාහන පද්ධතිය කෙරෙහි ජනතා විශ්වාසය හා මාර්ග පහසුකම් ඇති කිරීම සඳහා ඉහළ ප්‍රමිතියක් ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

4. මාර්ග තදබදය, මඟී තදබදය හා මාර්ග අනතුරු අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ, නීති රීති හඳුන්වා දීම.

5. රාජ්‍ය හා පෞද්ගලික ප්‍රවාහන සේවා හා දුම්රිය සේවා පොදු කාලසටහනකට අනුව ඒකාබද්ධ ආකෘතියක් යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණ ඊ - ටිකට් ක්‍රමයක් හඳුන්වා දීම.

6. දුම්රිය හා බස් රථ නැවතුම්පොළ ආශ්‍රිත පොදු පහසුකම් හා ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය

7. දුම්රිය හා බස් රථ සේවාව සඳහා අවශ්‍ය දුම්රිය හා බස් රථ නඩත්තු කිරීම.


8. බස් රථ නිෂ්පාදන හා ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ දේශීය කර්මාන්ත පද්ධතියක් ගොඩනැගීමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයන් හඳුන්වා දීම.

9. කොළඹ, හම්බන්තොට, කන්කසන්තුරේ සහ ත්‍රිකුණාමල වරායන් වෙත දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම.

10. තොරතුරු තාක්ෂණයේ යෙදීම මඟින් මෝටර් රථ ලියාපදිංචිය ජනතා හිතකාමී, කාර්යක්ෂම, දූෂණයෙන් තොර ක්‍රියාවලියක් බවට පත් කිරීම.

ප්‍රවාහන අමාත්‍යාංශය

## 1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන



## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

1. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

## 1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. ජාතික ගමනාගමන කොමිසම
2. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| ව්‍යාපෘතියේ නම | මූල්‍ය ප්‍රභවය | | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම (රු.මි.) | සමුච්චිත වියදම (රු.මි ) (2021.12.31 දිනට) | කාල සීමාව | සාරාංශගත ව්‍යාපෘති ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය/විදේශීය | ආයතනය | | | | % | විස්තර |
| කුරුණෑගල හබරණ දුම්රිය මාර්ග ව්‍යාපෘතිය (KHRP) | වි<br>දේ | -<br>මහා භාණ්ඩාගාරය | 948 USD.Mn<br>7,500.00 | 709.98 | 2016/09-2023/12 | භෞතික ප්‍රගතිය - 65.2 (මූලික අධ්‍යයනය කටයුතු සහ ඉඩම් අත්පත් කර ගැනීම) | ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම කටයුතු සිදු කරමින් පවතී. |
| ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම (TPPF) | වි<br>දේ | ADB<br>ශ්‍රී ලංකා රජය | 1,456.50<br>9,798.50 | 4,732.52 | 2018 ජනවාරි සිට 2023 ජනවාරි දක්වා | 42% | උපදේශන සේවා කටයුතු 2021 අප්‍රේල් 30 දිනට අවසන් වී ඇත. නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| දුම්රිය කාර්යක්ෂමතාව නැංවීමේ ව්‍යාපෘතිය (REIP) | වි<br>දේ | ADB<br>ශ්‍රී ලංකා රජය | 28,232.00<br>5,646.40 | 2,613.06 | 2019 සැප්තැම්බර් සිට 2025 ජුනි දක්වා | 7.7% | ව්‍යාපෘතියේ කටයුතු සිදු කරමින් පවතී. |
| මහව-ඕමන්ත දුම්රිය ව්‍යාපෘතිය | වි | Exim Bank (India) | 91.26 USD.Mn | 44.58 USD.Mn | 2019.07.18-2022.11.28 | | ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. |

දේ - දේශීය    වි - විදේශීය

## 02 පරිච්ඡේදය

**ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රගතිය හා අනාගත දැක්ම …**

ප්‍රවාහනය යනු ඕනෑම රටක සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වූ සේවාවක් වන අතර ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ යාමත් සමඟ ප්‍රවාහන සේවාවේ ද තිරසාර වර්ධනයක් ඇති විය යුතුය. ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනයත් සමඟ ප්‍රවාහනයට ඇති ඉල්ලුම වැඩි වීම මත පැන නැගී ඇති වාහන තදබදය, රිය අනතුරු වැඩි වීම හා පරිසර දූෂණය වැනි ගැටලු සලකා බලමින් ප්‍රවාහන ක්ෂේත්‍රයට කාලානුරූපී වෙනස්කම් එක් කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමට ප්‍රවාහන අමාත්‍යාංශය විවිධ ව්‍යාපෘති / වැඩසටහන් දියත් කරමින් සිටී.

“සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති රාමුවට අනුකූලව තිරසාර ලෙස ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ජාතික අයවැය මඟින් වෙන් කරනු ලැබූ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමුඛතා ක්ෂේත්‍රයන්හි ඵලදායි ලෙස ආයෝජනය කරමින් වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම සඳහා නව තාක්ෂණය, නව කළමනාකරණ මෙවලම් සහ මානව සම්පත් ප්‍රශස්ථ අයුරින් භාවිතා කිරීමට සියලු උත්සාහයන් දරමින් සිටී.

ඒ අනුව, බස්රථ හා දුම්රිය කේන්ද්‍ර කර ගනිමින් පොදු ජනතාවට කාර්යක්ෂම හා ලාභදායී ප්‍රවාහන සේවාවක් ලබා දීමට ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත.

දුම්රිය මඟින් මගී ප්‍රවාහනය දැනට පවතින 5% සිට 10% දක්වා වැඩි කිරීමේ අරමුණින් දුම්රිය සේවය වැඩිදියුණු කිරීමේ ප්‍රධාන පියවරක් ලෙස කොළඹ තදාසන්න ප්‍රදේශය ආවරණය කරනු ලබන ප්‍රධාන දුම්රිය මාර්ග හතරෙහි (මුහුදුබඩ, කැළණිවැලි, පුත්තලම් සහ ප්‍රධාන මාර්ග) මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකු (ADB) ණය යටතේ කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. එහි ව්‍යාපෘති සැලසුම් කිරීමේ තාක්ෂණික සහාය ලබා ගැනීම යටතේ සම්පූර්ණ දිග කි.මී.210 ක් සඳහා ශක්‍යතා අධ්‍යයන, විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සහ ප්‍රසම්පාදන ලේඛන සැකසීම අවසන් කර ඇති අතර, මහනුවර තදාසන්න ප්‍රදේශය තුළ දුම්රිය මාර්ග සංවර්ධනය සඳහා ශක්‍යතා අධ්‍යයනය සිදුකරමින් පවතී. මීට අමතරව මෙම ව්‍යාපෘතියේ අනෙකුත් සංරචකය වන දුම්රිය කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ දීප ව්‍යාප්ත විදුලි සංදේශ පද්ධතිය, සුහුරු ප්‍රවේශ පත් සහ ආසන වෙන් කිරීමේ පද්ධතිය යන වැඩකටයුතු දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. තවද, දුම්රිය මෙහෙයුම් හා පාලන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් හා දුම්රිය රක්ෂිතයේ සිටි අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සඳහා මාලපල්ල නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් ආරම්භ කර ඇත.

උතුරු දුම්රිය මාර්ගයේ මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවා වඩාත් කාර්යක්ෂම සහ සුවපහසු කිරීමේ අරමුණින් කි.මි. 128 ක් වන මහව-ඕමන්තේ අතර කොටස වැඩිදියුණු කිරීමේ මූලික කටයුතු දැනට ආරම්භ කර ඇති අතර, මෙමඟින් දුම්රිය වේගය පැයට කිලෝමීටර 100 ක් දක්වා වර්ධනය කරගත හැකි වේ.

පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වයෙන් මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ දිගුවක් ලෙස තවත් මගී මැදිරි 100 ක් පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, ඉන් 6 ක් පරීක්ෂණ ධාවනය සිදුකරමින් පවතින අතර 24 ක් ධාවනයට යොදවා ඇත.

එමෙන්ම, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර වශයෙන් ප්‍රීමා තිරිභුපිටි ත්‍රිකුණාමලයේ සිට සීදූව දක්වා ප්‍රවාහනය ආරම්භ කිරීම, හොල්සිම් ආයතනය සමඟ එක්වී අරුවක්කාරු සිට බුස්ස දක්වා හුණුගල් ප්‍රවාහනය ආරම්භ කර ඇති අතර, දැනට සිදු කරන ඛනිජ තෙල් ප්‍රවාහනය පුළුල්ව සිදු කිරීම සඳහා කොලොන්නාවේ සහ අනෙකුත් අංගනවල යටිතල පහසුකම් දියුණු කිරීම සිදු කෙරේ.

බස් රථ මගී ප්‍රවාහනය සංවර්ධනය කිරීම අරමුණු කොට ගෙන ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වේ. පොදු ප්‍රවාහන බස් සේවය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම මූලික කොට ගනිමින් පහසු හා විශ්වාසදායි පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමයක් හඳුන්වා දීම, ජංගම දුරකථන හා අන්තර්ජාලය ඔස්සේ බස් සේවා පිළිබඳ තොරතුරු ලබා ගැනීම හා ආසන වෙන් කරවා ගැනීම සඳහා මෘදුකාංගයක් සකස් කිරීම සහ MyBus-SL යෙදවුම හරහා බස් රථවල GPS සවි කිරීම ආදී කටයුතු දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. මීට අමතරව, සමාජ සුබසාධන ව්‍යාපෘතියක් වශයෙන් වාර්ෂිකව සිදු කරනු ලබන සිසුසැරිය, ගැමිසැරිය සහ නිසිසැරිය බස්රථ සේවා 2021 වසරේදී ද අඛණ්ඩව සිදු කරන ලද අතර, ඒ අනුව සිසුසැරිය නව සේවා 97 ක්, නිසි සැරිය නව සේවා 33 ක් ආරම්භ කරන ලදී.

පවත්නා දත්ත වලට අනුව මාර්ග අනතුරු හේතුවෙන් මෙරට වසරකට මිය යන ප්‍රමාණය පුද්ගලයින් 2,500-3,000 අතර පවතී. ඒ අනුව දිනකට පුද්ගලයන් 8 ක් පමණ මිය යන බව පෙනේ. මෙය සමාජයීය ගැටලුවක් වන අතරම රටේ ආර්ථිකයටද එය සෘජුවම බලපාන කාරණයක් බවට පත්ව තිබේ. පසුගිය වර්ෂවල සිදුවූ මාරක අනතුරුවලට වගකිව යුතු වාහන වර්ග වෙන්ව හඳුනා ගැනීමේදී යතුරුපැදි අනතුරු සංඛ්‍යාත්මකව ඉහල අගයක් ගනී. ඒ අනුව, මාර්ග අනතුරුවලින් තොර සමාජයක් බිහි කිරීමේ අරමුණින් විවිධ ක්‍රියාකාරකම්/ දැනුවත් කිරීමේ වැඩසටහන් පසුගිය වර්ෂය තුළ සිදුකර ඇත. ඒ අතුරින් මාර්ග රිය අනතුරු බහුලව සිදුවන ප්‍රදේශයන්හි තෝරා ගත් පාසල් සහ අවට පාසල් 10 ක සිසු සිසුවියන්ගේ හා ගුරුවරුන්ගේ සහභාගිත්වය ඇතිව “පාසල් මාර්ග ආරක්ෂණ කලාප” වැඩසටහන් දියත් කිරීම, රිය අනතුරුවලට වැඩි වශයෙන් මුහුණපාන යතුරුපැදි කරුවන්ගේ ජීවිත ආරක්ෂාව සඳහා SLS517 ප්‍රමිතියෙන් යුත් හිස් ආවරණයේ ඇති වැදගත්කම සහ යතුරුපැදි ධාවනය සම්බන්ධයෙන් සකස් කරන ලද දැනුවත් කිරීමේ අත්පත්‍රිකා මඟින් දීපව්‍යාප්තව දැනුවත් කිරීම, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් පළාත් 09 ආවරණය වන පරිදි පිහිටුවා ඇති “පළාත් මාර්ග ආරක්ෂණ ඒකක” මඟින් මාර්ග රිය අනතුරු අවම කිරීමේ ඒකාබද්ධ වැඩසටහන් දියත් කිරීම සහ රිය අනතුරු බහුල ස්ථානවල (Blackspot) හා ජනාකීර්ණ ස්ථානවල දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම දැක්විය හැක.

මීට අමතරව, 2021 වර්ෂයේදී වරදකරුවන් හඳුනා නොගත් රිය අනතුරු වලට ලක්වන වින්දිතයන්ට මූල්‍ය සහන ලබාදීම යටතේ රිය අනතුරු වලදී හජ්පා පලා යාමට ලක්ව මියගිය පුද්ගලයින්ගේ පවුල් සඳහා එක් අයෙකුට රුපියල් ලක්ෂ 02 බැගින් මරණකරුවන් 19 දෙනෙකුගේ යැපෙන්නන් සඳහා රුපියල් 3,800,000 ක් ගෙවා ඇති අතර, වරදකරුවන් හඳුනා නොගත් රිය අනතුරුවලින් ආබාධිත තත්ත්වයට පත්වූ පුද්ගලයින් සඳහා එක් අයෙකුට රුපියල් ලක්ෂය බැගින් තුවාලකරුවන් 26 දෙනෙකු සඳහා රුපියල් 2,575,000 ක මූල්‍ය පරිත්‍යාග ලබා දී ඇත.

රටේ පවතින වසංගත තත්ත්වය සහ ආර්ථික පසුබෑම හමුවේදී දුම්රිය ස්ථාන, බස් පර්යන්ත විෂබීජහරණයට ලක් කොට අත්‍යවශ්‍ය සේවාවන් සඳහා සේවයට වාර්තා කළ යුතු ජනතාවට අඛණ්ඩ ප්‍රවාහන සේවාවක් සැපයීමට කටයුතු කරන ලද අතර, දුම්රිය ස්ථාන හා බස් පර්යන්තයන්හි සනීපාරක්ෂක පහසුකම් ලබා දෙන ලදී. නිරෝධායන ඇඳිරිනීති සහ පළාත් සංචරණ සීමා පනවා ඇති කාලයේදී බස්රථ ධාවනය අත්හිටුවීමට සිදුවීම හේතුවෙන් පීඩාවට පත් අන්තර් පළාත් පෞද්ගලික බස් හිමියන් සහ පළාත තුළ පමණක් ධාවනය කරන බස් හිමියන් වෙත රාජ්‍ය අනුග්‍රහය යටතේ බැංකු ණය ලබා දුන් අතර මගී සේවා අවසරපත්‍ර සඳහා සහන ලබා දීමටත් කටයුතු කරන ලදී.

ජනතාව වැඩි වශයෙන් පොදු ප්‍රවාහන සේවාව වෙත ආකර්ෂණය කර ගැනීම මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති ප්‍රධාන අභියෝගයක් වන අතර, එයට සාර්ථකව මුහුණ දීමට හැකි වන්නේ ජනතා හිතවාදී, සුවපහසු කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ක්‍රියාත්මක කිරීම තුළිනි.

පර්යේෂණ ප්‍රතිඵල පාදක කර ගත් නවීන තාක්ෂණය මෙරටට උචිත පරිදි පොදු ප්‍රවාහනයේ උන්නතිය උදෙසා යොදා ගත යුතුය. ප්‍රවාහන ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ දැනුම ප්‍රවාහන ක්ෂේත්‍රයට ලබා දීම සඳහා පර්යේෂකයන් සහ පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් හා සන්නිවේදනයක් ගොඩ නඟා ගැනීම මේ සඳහා ඉතා වැදගත් වේ.

ඒ සඳහා මේ වනවිට e-mobility සහ Intelligent Transport System, හඳුනා ගත් කොරිඩෝවල බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන වැනි සාධනීය ක්‍රියාමාර්ග සැලසුම් කෙරෙමින් පවතින අතර භාණ්ඩ ප්‍රවාහනය සහ අනෙකුත් විවිධ ක්‍රම තුළින් දුම්රිය දෙපාර්තමේන්තුවේ ආදයම් වැඩිකර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට ඇත. ප්‍රවාහන ක්ෂේත්‍රයේ ආයෝජන ප්‍රමුඛතා නිර්ණය කිරීම, ප්‍රවාහන ඉල්ලුම කළමනාකරණය සහ පවතින ප්‍රවාහන මාධ්‍යයන්හි කාර්යක්ෂමතාව වැඩි කිරීම උදෙසා තත්කාලීන ප්‍රවාහන දත්ත ලබා ගැනීම සහ එම දත්ත ක්‍රමානුකූලව විශ්ලේෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙය අරමුණු කොට ගෙන අමාත්‍යාංශය තුළ පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් පිහිටුවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන 2022 වර්ෂය සඳහා වෙන් කොට ඇත. 2025 දක්වා මධ්‍ය කාලීන සැලසුමක් යටතේ සියලු අපේක්ෂිත කාර්යයන් ගොනු කර ඇති අතර, ඉදිරි කාලය තුළ දී එම කාර්යයන් ඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අමාත්‍යාංශය ක්‍රියාකරමින් සිටී.

**ආර්. ඩබ්. ආර්. පේමසිරි**
ලේකම්
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

# 03 පරිච්ඡේදය

## 2021 දෙසැම්බර්31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍යකාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

**2021 දෙසැම්බර් 31 දිනෙන්අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

රු.

| අයවැය 2021 රු. | | සටහන | තතය 2021 රු. | 2020 රු | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | | | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,319,614,000 | 11,047,870,204 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 34,638,345 | 13,194,696 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 10,777,675 | 13,360,288 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවනලැබීම් (ආ)** | | **1,365,030,020** | **11,074,425,187** | |
| - | **මුළු ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,365,030,020** | **11,074,425,187** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | **49,840,000** | **713,804.75** | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | **1,315,190,020** | **11,073,711,382** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | **-** | **-** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 142,800,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 130,901,323 | 141,618,362 | |
| 157,450,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 123,078,868 | 146,492,653 | ඒසීඒ2(ii) |
| 652,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 272,548,989 | 403,809,824 | |
| - | පොළී ගෙවීම් | **8** | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | - | 316,653 | |
| 952,250,000 | **මුළු පුනරාවර්තනවියදම් (ඊ)** | | **526,529,180** | **692,237,491** | |
| | **මූලධන වියදම්** | | | | |
| 11,835,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 6,640,768 | 401,458 | |
| 5,523,035,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 3,092,671,442 | 8,992,727,539 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | ඒසීඒ2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 1,400,000 | හැකියා වර්ධනය | **14** | 583,000 | 381,500 | |
| 597,800,000 | වෙනත් මූලධන වියදම් | **15** | 362,907,047 | 4,202,109,482 | |
| 6,134,070,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **3,462,802,257** | **13,195,619,979** | |
| | තැන්පතු ගෙවීම් | | 35,209,348 | 11,513,727 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 8,751,349 | 10,752,832 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | **-** | **-** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **43,960,697** | **22,266,559** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 4,033,292,134 | 13,910,124,029 | |
| 7,086,320,000 | **දෙසැම්බර් 31 දිනට ශේෂයඒ = (ඉ-එ)** | | (2,718,102,114) | (2,836,412,647) | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | (2,718,102,114) | (2,836,412,647) | ඒසීඒ-7 ඒසීඒ-3 |
| | | | - | - | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

### 2021 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 50,216,541,868 | 49,524,851,468 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 29,583,633 | 31,609,959 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **50,246,125,501** | **49,556,461,427** |
| **<u>ශුද්ධ වත්කම් /ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 27,763,273 | 29,218,596 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 50,216,541,868 | 49,524,851,468 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 1,820,360 | 2,391,363 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | | |
| **මුළු වගකීම්** | | **50,246,125,501** | **49,556,461,427** |

පිටු අංක 6 සිට 57 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 58 සිට 71 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි ම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර, මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ……………………… | ……………… | ………………………………….. |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි |
| නම : ආර්. ඩබ්. ආර්. පේමසිරි | නම : | නම:ඒ.ඒ.ටී.කේ.අදිකාරි |
| තනතුර: ලේකම් | තනතුර : | දිනය : |
| දිනය : | දිනය : | |

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන<br>2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | 713,805 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 22,726,090 | 21,090,832 |
| අග්‍රිම ලැබීම් | 1,319,614,000 | 11,047,156,399 |
| අත්තිකාරම් අයකර ගැනීම | 7,560,494 | 9,468,147 |
| තැන්පතු ලැබීම | 34,638,345 | 13,194,696 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **1,384,538,929** | **11,091,623,879** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 255,438,360 | 210,632,457 |
| සහනාධාර සහ මාරුකිරීම් වියදම් | - | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම් | 8,257,151 | 8,960,826,508 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 49,840,000 | 713,805 |
| අත්තිකාරම් ගෙවීම | 8,263,462 | 10,752,832 |
| තැන්පතු ගෙවීම | 35,209,348 | 11,513,727 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **357,008,321** | **9,194,439,329** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **1,027,530,608** | **1,897,184,550** |

| | | |
|---|---|---|
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | |
| **<u>අඩුකළා - මුදල් වැය කිරීම්:</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම් | 1,027,530,608 | 1,897,184,550 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **1,027,530,608** | **1,897,184,550** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(1,027,530,608)** | **(1,897,184,550)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ)** | | |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | |

| | | |
|---|---|---|
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

-

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු000,.

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස |
| 20.03.99.00 | වෙනත් ලැබීම් | 2,260 | 43,674.0 | 15,356.77 | 35% |
| 20.02.02.99 | ර.නි.අ.බ්. පොළි | 1,540.0 | 1,285.43 | 1,224.55 | 95% |
| 20.03.03.02 | දඩ සහ රාජසන්තක කිරීම් | 30.0 | 100.0 | 244.65 | 245% |
| 20.02.01.01 | ගෙවල් කුලී | 230.34 | 217.50 | 185.00 | 85% |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු000,.

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 955,950,000 | 952,250,000 | 526,529,179.78 | 55.29% |
| ප්‍රාග්ධන | 5,996,600,000 | 6,134,070,000 | 3,462,802,257.23 | 56.45% |

**3.7** මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු000, .

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | කුරුණෑගල දි/ලේ | කුරුණෑගල-හබරණ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කරගැනීම පරිපාලන වියදම් දැරීම සඳහා | 1,678,100 | 1,678,100 | 1,671,809.22 | 99.63% |
| 02 | අනුරාධපුර දි/ලේ | | 400,000 | 400,000 | 400,000 | 100% |
| 03 | පොලොන්නරුව දි/ලේ | | 400,000 | 400,000 | 400,000 | 100% |
| 04 | මාතලේ දි/ලේ | | 1,333,200 | 1,333,200 | 1,333,200 | 100% |

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000,

| වත්කම් කේතය | කේත විස්තරය | **31.12.2021** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **31.12.2021** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | | | |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, Computerized Integrated Government Accounting System (CIGAS) යෙදවුම මඟින් ලබා ගත් වාර්තාව - **ඇමුණුම 01** මඟින් දැක්වේ.

**3.9** විගණකාධිපතිවරයාගේ වාර්තාව **

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව - **ඇමුණුම 02** මඟින් දැක්වේ.

# 04 පරිච්ඡේදය

**කාර්ය සාධන දර්ශක**

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| **දුම්රිය අංශය** | | | |
| ➢ භාණ්ඩ ප්‍රවාහන දුම්රිය සංඛ්‍යාව | | | √ |
| ➢ දිනකට ක්‍රියාත්මක වන දුම්රිය සංඛ්‍යාව | | √ | |
| ➢ ප්‍රධාන දුම්රිය ව්‍යාපෘති සංඛ්‍යාව | | √ | |
| ➢ ඉදි කළ දුම්රිය මාර්ග (දිග කි.මී) | √ | | |
| **බස් රථ අංශය** | | | |
| ➢ නව සිසුසැරිය, ගැමිසැරිය, හා නිසිසැරිය බස්රථ සේවා සංඛ්‍යාව | | √ | |
| ➢ නව තාක්ෂණය පදනම් කරගත් සේවා සංඛ්‍යාව | | | √ |
| ➢ වසරකට පුහුණු කරන ලද බස් කාර්ය මණ්ඩල සංඛ්‍යාව | | | √ |
| ➢ ක්‍රියාත්මක කරන ලද කාලසටහන් සංඛ්‍යාව (ඒකාබද්ධ සහ ඒකාබද්ධ නොවන) | | | √ |
| **මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව** | | | |
| ➢ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන් පිළිබඳ විස්තර | √ | | |
| **අමාත්‍යාංශයේ කාර්ය සාධන දර්ශක** | | | |
| ➢ පවත්වා ඇති ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව | | | √ |
| ➢ පොදු ප්‍රවාහන සේවාව කාර්යක්ෂම කිරීම උදෙසා ක්‍රියාත්මක වන ව්‍යාපෘති සංඛ්‍යාව | √ | | |
| ➢ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා ලබා දී ඇති පුහුණුවීම් සංඛ්‍යාව | | | √ |
| ➢ පාර්ලිමේන්තුව වෙත වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වාර්තා සංඛ්‍යාව | √ | | |
| ➢ අමාත්‍යාංශය වෙත ලැබෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් වැය කරන ලද ප්‍රතිශතය | √ | | |
| ➢ වර්ෂය තුළ පවත්වා ඇති විගණන හා කළමනාකරණ කමිටු සංඛ්‍යාව | √ | | |

# 05 පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම | 2030 වන විට මහා මාර්ගවල සිදු වන අනතුරුවලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම | මරණ අනුපාතය (2019 වසරට සාපේක්ෂව) | √ | | |
| නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්ත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින් සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහා මාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මඟින් 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබා ගත හැකි ප්‍රවේශ විය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම. | 1. භාණ්ඩ ප්‍රවාහන දුම්රිය සංඛ්‍යාව | | √ | |
| | | 2. දිනකට ධාවනය කරන දුම්රිය සංඛ්‍යාව | | | √ |
| | | 3. ප්‍රධාන දුම්රිය ව්‍යාපෘති සංඛ්‍යාව | | | √ |
| | | 4. නව සිසුසැරිය, ගැමිසැරිය, හා නිසිසැරිය බස්රථ සේවා සංඛ්‍යාව | | | √ |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

**තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග**

2015 වර්ෂයේ දී පවත්වන ලද තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේදී සම්මත කරගත් 2030 න්‍යාය පත්‍රයට අනුකූල වෙමින් සමස්ත සංවර්ධනයට ඵලදායි ලෙස දායකත්වයක් සැපයීම අරමුණු කොට ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ශක්තිමත් ප්‍රවාහන සේවාවක් ඇති කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය පියවර රැසක් මේ වනවිට දියත් කර ඇත.

තිරසාර සංවර්ධන අරමුණු තුළ ඉලක්ක කිහිපයක් සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රය සෘජු දායකත්වයක් දක්වන අතර අනෙකුත් ක්ෂේත්‍ර ගණනාවක ඉලක්ක සඳහා වක්‍ර දායකත්වයක් සපයයි. ඒ අනුව අරමුණු 3,9 සහ 11 යටතේ ප්‍රවාහන ක්ෂේත්‍රයට සෘජු ලෙස අදාළ ඉලක්ක හඳුනාගත හැක.

<u>**11 වන තිරසාර සංවර්ධන අරමුණ**</u>

11.2 අවදානමට ලක් විය හැකි තත්ත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින්, සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මඟින් 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී අඩු මිළට ලබා ගත හැකි ප්‍රවේශ විය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම.

- පහසුකම් අවම ප්‍රදේශවල ජනතාවගේ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් සමාජ සුබසාධක බස් සේවා ලෙස "සිසුසැරිය", "ගැමිසැරිය" සහ "නිසිසැරිය" සේවා සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කිරීම. ඒ අනුව සිසුසැරිය නව සේවා 97 ක්, නිසි සැරිය නව සේවා 33 ක් 2021 වසරේදී ආරම්භ කරන ලදී. සිසුසැරිය මඟින් පාසල් සිසුන්ට ආරක්ෂිත සහ විශ්වාසනීය පොදු ප්‍රවාහන බස් රථ සේවාවක් ලබා දෙන අතර ගැමිසැරිය සේවාව, නගරයෙන් දුරස්ථව ජීවත්වන ජනතාවට පහසුකම් සැලසීම වෙනුවෙන් ක්‍රියාත්මක වේ. නිසිසැරිය සේවාව, රාත්‍රී හා අලුයම් කාලයේ මගී ජනතාවගේ ප්‍රවාහන පහසුකම් සපුරාලීම සඳහා ක්‍රියාත්මක වේ.

<u>**9 වන තිරසාර සංවර්ධන අරමුණ**</u>

9.1 ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

- දැනට පවතින දුම්රිය මාර්ග ජාලය පුළුල් කිරීම සහ පවතින ජාලය වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘතිය
- මාතර කතරගම දුම්රිය මාර්ග ව්‍යාපෘතිය, කුරුණෑගල හබරණ  දුම්රිය මාර්ග ව්‍යාපෘතිය, මහව සිට ඕමන්තෙයි දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සහ කොළඹ තදාසන්න දුම්රිය මාර්ග ව්‍යාපෘතිය
- දුම්රිය ඇණිය ශක්තිමත් කිරීම සඳහා නව දුම්රිය කට්ටල මිලදී ගැනීම, මගී මැදිරි පුනරුත්ථාපනය කිරීම සහ දුම්රිය ඇණියේ අඛණ්ඩ නඩත්තු හා අලුත්වැඩියා කටයුතු ද සිදු කිරීම.

- මගී පහසුව සහ ආරක්ෂාව සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් දුම්රිය තුළට ප්‍රවේශ වීම සහ පිටවීම පහසු කරලීම සඳහා වේදිකා ඉස්සීම සහ දීර්ඝ කිරීමේ කටයුතු සිදු කිරීම සහ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා ප්‍රවේශය පුළුල් කිරීම.
- මගී ප්‍රවාහන නියාමන ආයතනය වන ජාතික ගමනාගමන කොමිසමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීමේ ව්‍යාපෘතිය තුළින් මහජනතාවට ඉක්මන් සේවාවක් ලබා දීම. ඒ අනුව, 2021 වර්ෂයේදී මගී සේවා අවසරපත්‍රය වෙනුවට NFC කාඩ්පතක් නිකුත් කිරීම.
- දුරගමන් සේවා දුම්රිය හා බස් රථවල ආසන මාර්ගගතව වෙන් කිරීමේ වැඩපිළිවෙල දියත් කිරීම

<u>3 වන තිරසාර සංවර්ධන අරමුණ</u>

3.6 2030 වන විට මහාමාර්ග වල සිදු වන අනතුරු වලින් සිදුවන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම.

මාර්ග අනතුරුවලින් දෛනිකව මරණ 8 ක් පමණ වාර්තා වන අතර, අනතුරුවලින් විශාල වශයෙන් මරණයට හෝ අබාධිත තත්ත්වයට පත්වන්නේ ශ්‍රම බලකායට අයත් වයස් කාණ්ඩවල පුද්ගලයන් ය. මෙය රටේ ආර්ථිකයට මෙන්ම සමාජයීය වශයෙන් ද ගැටලු ඇති කරයි.

එබැවින්, මාර්ග අනතුරු අවම කර ගනිමින් තිරසාර සංවර්ධන අරමුණු යටතේ අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම ප්‍රමුඛත්වයක් ලෙස සලකා ප්‍රවාහන අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ලැබේ.

- මාර්ග ආරක්ෂාව පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරිම සහ පාසල් ආශ්‍රිතව ආරක්ෂිත කළාප ස්ථාපිත කිරිම යටතේ රිය අනතුරු බහුල ප්‍රදේශවල පිහිටි පාසල් ප්‍රමුඛතා ගතකර, පළමු අදියර ලෙස දිස්ත්‍රික්ක 08 ක් නියෝජනය වන පරිදි පාසල් 10 ක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- නව දුම්රිය හරස් මාර්ග ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- රිය අනතුරු බහුල ස්ථානවල (Blackspot) හා ජනාකීර්ණ ස්ථානවල දැනුවත් කිරීමේ පුවරු සවිකිරීම
- මාර්ග ආරක්ෂාව නියාමනය සහ කළමනාකරණය සඳහා ශ්‍රී ලංකා මාර්ග අනතුරු දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම

<u>තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමේ දී මුහුණ දෙන අභියෝග</u>

- විශාල ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ආයෝජන සපයා ගැනීමේ ගැටලු
- ඉඩම් නිරවුල් කිරීමේ ගැටලු
- සේවක ගැටලු සහ අනපේක්ෂිත වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග
- ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධව සිදු කරන පර්යේෂණ ප්‍රතිඵල/ සොයාගැනීම්, ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට ප්‍රයෝගිකව යොදා ගැනීමේ දී ඇතිවන දුර්වලතා
- නව තාක්ෂණය යොදා ගැනීමේ දී ඇතිවන තාක්ෂණික ගැටලු

## 06 පරිච්ඡේදය

**මානව සම්පත් පැතිකඩ**

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 24 | 21 | 3 |
| තෘතීයික | 4 | 3 | 1 |
| ද්විතියික | 96 | 96 | 4 |
| ප්‍රාථමික | 55 | 47 | 4 |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන අයුරු

අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ඉටු කරලීම වෙනුවෙන් ඉලක්ක ගත අරමුණුවලට ළගාවීමේ දී මානව සම්පත් හිඟය ඍජු බලපෑමක් සිදු කරන අතර, අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට වැයවන කාල සීමාවන්හි වැඩිවීමක් සිදුවීමේ හැකියාවක් ඇත.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රුපියල්) | | වැඩසටහනේ ස්වභාවය (දේශිය/ විදේශිය) | නිමැවුම / ලබා ගත් දැනුම * |
|---|---|---|---|---|---|---|
| | | | දේශිය | විදේශිය | | |
| 14th Edition of International Railway Equipment Exhibition (IREE) | 02 | 17-20 දෙසැම්බර් | - | 50,720.00 | විදේශිය | - |
| **මුළු ආයෝජනය** | | | | **50,720.00** | | |

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන අයුරු

අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරින් හා අනෙකුත් නිලධාරින් පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම තුළින් අමාත්‍යාංශය තුළ තමන්ට නියම වී පවතින රාජකාරි වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇත. තවද මාණ්ඩලික නිලධාරින් විදේශිය පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම තුළින් ලබන අත්දැකීම් තම රාජකාරියට අනුකූල කර ගැනීම හා එමඟින් කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සිදු කර ඇත. එමෙන්ම විදේශිය පුහුණු ලැබීම තුළින් නිලධාරින් අභිප්‍රේරණය වන අතර, ඒ තුළින් ලබා ගන්නා දැනුම හා කුසලතා උපයෝගී කර ගනිමින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනයක් ඇති කරලීමට හැකියාව ලැබී ඇත. (ඒ හා සම්බන්ධව සහතික පත්‍ර හා වාර්තාවන් අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.)

## 07 පරිච්ඡේදය

### අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිගත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | අනෙකුත් ආයතන හා ව්‍යාපෘති වලින් නියමිත දිනට පිළිතුරු නොලැබීම | මේ පිළිබඳ අදාල ආයතන හා ව්‍යාපෘති දැනුවත් කර ඇත. |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | - | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |

| | | | |
|---|---|---|---|
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශ වෙනස් වීම, අමාත්‍යාංශයේ විෂය පථය වෙනස්වීම, පාලනාධිකාරියේ හා කාර්ය මණ්ඩලයේ වෙනස් වීම හා පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම කාර්යයන් ප්‍රමාද වී ඇති අතර ඉදිරියේදී මීට අදාළ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශ වෙනස් වීම, අමාත්‍යාංශයේ විෂය පථය වෙනස්වීම, පාලනාධිකාරියේ හා කාර්ය මණ්ඩලයේ වෙනස් වීම හා පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම චක්‍රලේඛ ප්‍රකාර කාර්යයන් ප්‍රමාද වී ඇති අතර ඉදිරියේදී මීට අදාළ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල නොවේ | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | |